# පොළොන්නරු රාජ්‍ය සමයේ විදේශීය සබඳතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

## A critical study on diplomatic relations during the Polonnaruwa period

සම්පත් සුරංග ජයසිංහ


## Abstract

In 1070 AD, King Vijayabahu saved the country from the Chola invaders and selected Polonnaruwa as their capital. The anarchy of Rajarata, due to King Mihidu-V's leaving Anuradhapura and fleeing to Ruhuna, was a great opportunity for the Chola invaders who were looking to seize the power of Sri Lanka. Further, at that time, the power of trade in the Indian Ocean was under the authority of the Cholas. Consequently, the Chola rulers remained in Polonnaruwa alias "Kandawuru Nuwara" as their kingdom for over 60 years until the great king Vijayabahu-I saved the country by defeating and dispelling the Cholas and selected the Polonnaruwa as his kingdom. During the Polonnaruwa period, there is substantial evidence to suggest that Sri Lanka maintained diverse and multifaceted relations with foreign nations. These relationships encompassed political alliances, economic exchanges, religious interactions, and even marital ties. Notably, during King Vijayabahu the First's reign, friendly relations were fostered with Burma, and trade activities with India flourished. Subsequently, as King Great Parakumbahu developed the country and enhanced foreign relationships, the reign of Great Parakramabahu was a unique

period of Polonnaruwa reign. He conquered several foreign countries and at the same time maintained relationships with various countries. Despite the Polonnaruwa era spanning just two centuries, it stands out as a unique phase in Sri Lanka's history, one that profoundly enriched the island nation across all facets of life.

**Keywords:** Chola, Foreign, Parakramabahu, Polonnaruwa, Vijayabahu

**ප්‍රවේශය**

පණ්ඩුකාභය මහරජුගෙන් ආරම්භ වූ අනුරාධපුර රාජධානිය, පස්වන මිහිඳු රජුගෙන් අවසන් වන්නේ අඛණ්ඩව වසර එක්දහස් පන්සියයක් පමණ කාලයක් ලංකාවේ අගනගරය වශයෙන් පැවතීමෙන් පසුවය. එම කාල පරාසය තුළ රජවරු එකසිය පනහකට අධික සංඛ්‍යාවක් අනුරාධපුර රාජධානියේ රාජ්‍යත්වය හොබවා ඇති අතර මෙම රාජධානි සමය ලංකා ඉතිහාසයේ සුවිශේෂී අවදිය වශයෙන් සැළකිය හැකිය. සමස්ථයක් ලෙස ගත් කළ අනුරාධපුර රාජධානි සමය යස ඉසුරින් ආඪ්‍ය වූ සෞභාග්‍යවත් කාල වකවානුවක් වශයෙන් සැළකේ. එහෙයින්ම අනුරාධපුර රාජධානිය වරින් වර විදේශීය ආක්‍රමණිකයන්ගේ ග්‍රහණයට නතු විය. අනුරාධපුර යුගයේ අවසන් පාලකයා වූ පස්වන මිහිඳු රජු මෘදු ගති ගුණ ඇති පාලකයෙක් වශයෙන් මහාවංශය පෙන්වා දේ. රජුට රටේ ජනතාව අයබදු ආදිය දීමෙන් වැළකී සිටි අතර එබැවින් රජු වස්තු හීනව තම විදෙස් හමුදාවන්ට වැටුප් ගෙවා ගත නොහැකි තත්වයකට පත් වූ බව මහාවංශය සඳහන් කරයි. (මහාවංශය, 249 පිටුව). වැටුප් නොළද කේරළ කුළී හමුදාව මාලිගාව අසලට රැස්ව අරගල කරන්නට වූ හෙයින් රජුට සිදු වූයේ අනුරාධපුර රාජ්‍යය හැර රුහුණුට පළා යෑමටය.

පස්වන මිහිඳු රජුට ජනතාව අවනත නොවීමත් සමග රජරට ඇති වූ දේශපාලන වියවුල් ස්වභාවය හේතුවෙන් රජු රුහුණට පළා ගිය පසු කේරළ, සිංහල හා කර්ණාටක යන පිරිස්

තම තමන්ට රිසි පරිදි රජරට පාලනය කළ බැව් මහාවංශය අනාවරණය කරයි. (මහාවංශය, 249 පිටුව). මෙම අවධිය වන විට චෝල රාජ්‍යය දකුණු ඉන්දීය දේශපාලනය තුළ ඉතා ප්‍රබල තත්වයක සිටි අතර එවකට චෝල පාලකයා වූයේ රාජරාජ චෝල (ක්‍රි.ව. 985-1014) රජුය. ඔහු තම රාජ්‍යයේ බලය ව්‍යාප්ත කිරීමට මහත් වෙහෙසක් දැරූ පාලකයෙකි. (Sastri, p.168). රාජරාජ චෝලයන් චෝල රාජ්‍යයේ බලය සමස්ත දකුණු ඉන්දියාව සිසාරා බලපවත්වා තිබූ අතර ලංකා රාජ්‍යයේ වියවුල් ස්වභාවය වෙළෙන්දකු මගින් දැන ලංකාව ආක්‍රමණය කර රාජ්‍ය බලය ලබා ගෙන ඇත. (මහාවංශය, 249 පිටුව.) චෝල පාලකයන්ට ලංකාවේ දේශපාලන බලය සියතට ගැනීමට මූලික වශයෙන් හේතු සාදක වූයේ ඔවුන්ගේ වෙළඳ ආධිපත්‍යය ව්‍යාප්ත කිරීමට සහ සිය අධිරාජ්‍යයේ සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම පිණිසය. තත්කාලීනව අරාබි ජාතිකයන් මුහුදු වෙළඳාම් කටයුතුවල සාර්ථක ලෙස නිරත සිටි අතර ඔවුන් සතු වූ වෙළඳ බලයද, චෝල වෙළඳ අධිකාරිය සතු කර ගැනිමේ මෙහෙයුමක් මේ වන විට දියත්ව පැවතිණි.

ලාංකේය මුලාශ්‍රයන්ට අනුව, රාජ රාජ චෝල රජුට පෙරත් චෝල රජවරු ලංකාව යටත් කර ගැනීමට උත්සාහ ගත් බවට ඉතිහාසය සාක්ෂි දරයි. මේ සම්බන්ධව ඇතැම් කරුණු කාරණා මහාවංශයේ සඳහන් නොවුණද පූජාවලියේ සඳහන් වන්නේ, පස්වන දප්පුල රජතුමා සොළී රටින් ආ සොළීන් මරා දැමූ බවයි. (පූජාවලිය, 781 පිටුව). සිව්වන මිහිඳු රජ දවස චෝලයන් ඌරාතොටට ගොඩ බැස ලංකාවේ බලය අල්ලා ගැනීමට වෑයම් කළ අවස්ථාවක එම උත්සාහය සිංහලයන් විසින් ව්‍යාර්ථ කර ඇති බවත් එහි සඳහන් වේ. (එම, 782 පිටුව). සිව්වන මිහිඳු රජු මහ තේජස්, මහසෙන්, මහයසස් ඇති රජකු වශයෙන් මහාවංශයෙහි සඳහන් වේ. එතුමා දවස සොළී රජෙකු ලංකාව ආක්‍රමණය කළ බවක් මහාවංශයෙහි සඳහන් නොවුණද සොළී රජු හා ඔහුගේ බළසෙන් විසින් ගිනිතබා විනාශ කළා යැයි කියන ලද සිත්කළු ප්‍රාසාදයක් සිව්වන මිහිඳු රජු විසින් නැවත කර වූ බව මහාවංශයේ සඳහන් වේ. (මහාවංශය, 246 පිටුව). මහාවංශ කතුවරයා සොළී ආක්‍රමණය පිළිබඳව දැන සිටිය ද ඒ

පිළිබඳ සෘජු සඳහනක් නොකිරීම විශේෂත්වයකි. සිව්වන මිහිඳු රජු චෝලයන්ගෙන් විය හැකි අනතුර දන කාලිංග දේශය හා මිත්‍ර සම්බන්ධතා ගොඩ නගා ගත් අතර රජු කාලිංග කුමාරිකාවක් අග මෙහෙසිය කරගෙන ඇත. (Mendis, 1940, p.49). මෙකල සිදු වූ විවාහ සබඳතා හුදෙක් දේශපාලනමය වශයෙන් ශක්තිමත් වීම අරභයා සිදු වූවක් වන අතර මේ වන විට චෝලයන් දේශපාලනමය වශයෙන් බලවත් වූ අතර කාලිංග රාජ්‍යයේ බලය හීනව පැවතියේය. චෝල රාජ්‍යය බලවත් වූ මෙවැනි අවස්ථාවල සිංහල, පාණ්ඩ්‍ය, කේරළ යන රාජ්‍යයන් එක්ව කටයුතු කර ඇත. (Sastri, 1955, p.169).

### පොළොන්නරුව රජරට පාලන මධ්‍යස්ථානය බවට පත්වීම

සිව්වන මිහිඳු රජතුමාගෙන් අනතුරුව එතුමාගේ පුත් දොළොස් වියැති පස්වන සේන කුමරු රාජ්‍යත්වයට පත්වන අතර ඒ රජුගේ රාජ්‍ය සමයේ අනුරාධපුර රාජධානිය දේශපාලනික වශයෙන් අස්ථාවරභාවයට පත් වේ. අනතුරුව රාජ්‍යත්වයට පත්වන්නේ අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා වූ පස්වන මිහිඳු රජතුමාය. ඉහත සඳහන් කළ පරිදි පස්වන මිහිඳු රජු රජරටින් පළාගිය පසු අරාජිකත්වයට පත්වන රජරට බලය රාජරාජ චෝලයන් විසින් අල්ලා ගනු ලබයි. (Sastri, 1955, p.172). අනතුරුව රජරට චෝල අධිරාජ්‍යයේ කොටසක් වශයෙන් පාලනය වී ඇත. චෝලයන් අනුරාධපුර රාජධානිය අත්හැර, සිය පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගනු ලබන්නේ පොළොන්නරුව රාජධානියයි. සෙනරත් පරණවිතාන මහතාට අනුව දුටුගැමුණු රාජ සමයේ විජිතපුරය වශයෙන් ප්‍රසිද්ධ බල කොටුව අයත් වන්නේ ද පොළොන්නරුවටය. එමෙන්ම එතුමා සඳහන් කරන්නේ රජරට රජවරුන් රුහුණෙන් පැමිණිය හැකි ආක්‍රමණ වලින් තම රාජ්‍යය රැක ගැනීම සඳහා හමුදාවක් මෙම ස්ථානයේ නවත්වා ඇති බවය. එහෙයින් එම පුරයට අතීතයේ පටන් කඳවුරු නුවර, කඳවුරුපුර නුවර යන නාමයන් භාවිතා වී තිබේ. කඳවුරු නුවර හෙවත් පොළොන්නරුව රජරට අගනුවර බවට ස්ථිරවම පත් වන්නේ චෝළ ආධිපත්‍යයට යටත් වීමෙන්

අනතුරුවය. මහාවංශයේ මෙම ආක්‍රමණය සොලී ආක්‍රමණයක් වශයෙන් සඳහන් වුවද එකල චෝල රජු වූ රාජරාජ චෝල රජු පිළිබඳව හා ඔහුගේ රාජ්‍ය සමය පිළිබඳ තොරතුරු හමුවන්නේ දකුණු ඉන්දියාවේ හා රජරට ඔහු විසින් පිහිටුවා ඇති ශිලාලේඛන ආශ්‍රයෙනි.

රාජරාජපෙරුමාල් (Veluppillai. 1971, p. 13) හෙවත් රාජරාජ චෝල රජු (985-1014) සිංහලයන් විසින්, දීර්ඝ කාලයක් සිය රාජධානිය වශයෙන් පවත්වා ගෙන ආ අනුරාධපුර රාජධානිය පසෙකලා පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගැනීමට ප්‍රධාන හේතුව ගෝකණ්ණ වරාය අනුරාධපුරයට වඩා පොළොන්නරුවට ආසන්නයේ පිහිටා තිබීමය. පොළොන්නරු රාජධානිය මහවැලි ගඟ අසබඩ පිහිටා තිබීමත් මහවැලි ගංඟාව ඔස්සේ පොළොන්නරුවේ සිට ගෝකණ්ණ වරායට පහසුවෙන් ළඟා වීමට ඇති හැකියාවත් නිසා පොළොන්නරුව චෝලයන් විසින් සිය පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගන්නට ඇත. මෙම වකවානුව තුළ චෝලයන් සිය වෙළෙඳ උපාය මාර්ගයන් කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වා ඇති බව පෙනේ (Silva, Bandaranayake and Dewaraja, 2003, p.102). අනුරාධපුර අවධියේ මහාතිත්ථ වරාය ලංකාවේ ප්‍රධාන වරාය වූ නමුත් රාජරාජ චෝල අවධිය වන විට ගෝකණ්ණ වරාය ලංකාවේ ප්‍රධාන වරාය බවට පත්ව ඇත. පොළොන්නරුව උපනගරයක්ව පැවති සමයේ සිට අත්කරගෙන තිබූ දියුණුවත්, කාලයක් තිස්සේ අනුරාධපුර රාජධානියේ පැවැති දේශපාලන අස්ථාවරභාවය හේතුවෙන් සිදු වූ පරිහානියත් ඒ සඳහා හේතු වන්නට ඇත.

රාජරාජ චෝල රජුගේ රාජ්‍යත්වයෙන් විසිනව වැනි අවුරුද්දේ පිහිටුවන ලද තිරුවලංගාඩු ශිලාලේඛනයෙහි ඉලාමණ්ඩලම් යන නාමයෙන් ශ්‍රී ලංකාව හඳුන්වා තිබේ (Sastri, 1955, p.172). රාජරාජ චෝල රජුට පෙර පළමු පරන්තක චෝල රජු ලංකාව යටත් කර මදුරයියුම් ඊලාමුම් කොණ්ඩ යනුවෙන් අන්වර්ථ නාමයකින් තමා හඳුන්වාගෙන ඇත. ඉන් තහවුරු

වන්නේ ලංකාව යටත් කරගැනීම ඔවුන් තුළ පැවති ප්‍රබල අපේක්ෂාවක් බවත් එය ඉටු කරගැනීම එතරම් පහසු කටයුත්තක් නොවන බවත්ය. චෝල අධිරාජ්‍යයේ මෙන්ම එවකට ඔවුන් සතු වූ මුහුදු වෙළඳ අධිකාරියේ ආරක්ෂාව, ලංකාව යටත් කර ගැනීමෙන් වඩ වඩාත් තහවුරු වන හෙයින් ලංකාවේ දේශපාලන පසුබිම සම්බන්ධයෙන් ඔවුන්ගේ නිබඳ අවධානය යොමු වන්නට ඇත. සුමාත්‍රා දූපත් වලින් හමු වී ඇති ශිලාලේඛනයකින් තහවුරු වන්නේ චෝලයන් සුමාත්‍රා දූපත් දක්වා සිය වෙළඳ සම්බන්ධතා පුළුල් කර තිබූ බවයි. එහෙයින් ගෝකණ්ණ වරාය ඔවුන්ගේ වෙළඳ කටයුතු පවත්වා ගෙන යාමේදී ඉතා වැදගත් සාධයක් වූ හෙයින් චෝල පාලකයන්ට පොළොන්නරුව විශේෂිත ස්ථානයක් වී ඇත. රාජරාජ චෝල රජු පොළොන්නරුව අගනුවර බවට පත් කරගෙන රජරට පාලන කිරීමේදී රජරට මුම්මඩි සෝල මණ්ඩලම් (Sastri, 1955, p.172). යන නාමය යටතේ නාඩු හෙවත් දිස්ත්‍රික්ක (Veluppillai, 1971, p. 13) කිහිපයකට බෙදා ඉන්දියාවේ කොටසක් වශයෙන් පාලන කටයුතු මෙහෙයවා ඇත. චෝලයන් ලංකාවෙන් අය කරගත් බදු මුදල් දකුණු ඉන්දියාවේ කෝවිල් නඩත්තු කිරීම සඳහා යොදවා ඇත.

පොළොන්නරුව ජනනාථ මණ්ඩලම් යනුවෙන් හැඳින්වෙන්නේ රාජරාජ චෝලයන්ගේ පුත් රාජේන්ද්‍ර චෝල රජු සමයේය. රුහුණට පලා ගිය පස්වන මිහිඳු රජුව, ක්‍රි.ව. 1017 වර්ෂයේදී පමණ ජීවග්‍රහණයෙන් අල්ලගන්නා රාජේන්ද්‍ර චෝල රජු (ක්‍රි.ව. 1012-1044) (Sastri, 1955, p.172). ලංකා රාජ්‍යය සිය ආධිපත්‍ය යටතට ගන්නා ලදී. චෝලයන් සමස්ථ ලංකා රාජ්‍යය හැඳින්වීම සඳහා භාවිතා කර ඇත්තේ ඉලමණ්ඩලම් යන නාමයයි. මෙම වකවානුව තුළ ලංකාව පාලනය කළ ඇතැම් සොළී පාලකයන් බෞද්ධ විහාරස්ථාන සඳහා යම් යම් වරප්ප්‍රසාදයන් පිරිනැමුවද මහාවංශයේ සඳහන් වන්නේ සොළීහු පොළොන්නරුව ඇසුරු කරමින්, තුන් නිකායික දාගැබ් සියල්ල බිඳ විනාශ කරමින් ඕජස් උරණ යකුන් සෙයින් ලක්දිව්හි සාරය ගත් බවය. (මහාවංශය, 249 පිටුව) මේ ආකාරයෙන් චෝල පාලකයන් අවුරුදු හැටකට අධික කාලයක් ලංකා රාජ්‍යයේ පාලන කටයුතු

මෙහෙය වූයේ පොළොන්නරු රාජධානිය මුල් කරගෙනය. චෝල පාලන සමය තුළ පොළොන්නරුව ඉතාමත් ශක්තිමත්ව ස්ථාපිත වූ අතර, ශිව විෂ්ණු ආදි දෙවියන් මුල් කරගත් හින්දු ආගමික නිර්මාණ රාශියක් ඉදි වී ඇත. රාජරාජ චෝල රජුගෙන් ආරම්භ වූ පොළොන්නරුව රාජධානිය රාජේන්ද්‍ර චෝල, රාජාධිරාජ චෝල, දෙවන රාජේන්ද්‍ර චෝල, වීර රාජේන්ද්‍ර චෝල හා ප්‍රතිරාජේන්ද්‍ර චෝල යන පාලකයන් ක්‍රි.ව. 1070 තෙක් අඩ සිය වසකට වැඩි කාලයක් ලංකාව පාලනය කර ඇත.

### පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ විදේශ සබඳතා

පළමුවන විජයබාහු රජු ලංකා ඉතිහාසය තුළ හමුවන සුවිශේෂී රාජ්‍ය පාලකයෙකි. නාඩු හෙවත් මණ්ඩල නැතහොත් දිස්ත්‍රික්ක වශයෙන් බෙදා චෝල අධිරාජ්‍යය යටතේ ක්‍රි.ව. 1070 තෙක් පාලනය වූ ලංකාව මහත් පරිශ්‍රමයක් දරා මුදාගනු ලැබුවේ පළමුවන විජයබාහු රජු (ක්‍රි.ව. 1155-1110) විසිනි. එතුමා ක්‍රි.ව. 1155 සිට රුහුණු රාජ්‍යයේ පාලකයා වශයෙන් කටයුතු කළ ද රාජාභිෂේකය ලබන්නේ අනුරාධපුරය චෝල පාලනයෙන් මුදා ගැනීමෙන් අනතුරුවය. විජයබා රජු රුහුණේ පාලකයා වුවද, මුල් අවධියේ ප්‍රබළ චෝල අධිරාජ්‍යයට එරෙහිව නැගී සිටීමට තරම් ඔහු ශක්තිමත් නොවූහ. එතුමාට ඉන්දියාවේ මිත්‍ර රාජ්‍යයන් හා සබඳතා පැවැත්වීමට හෝ යුද ආධාර ගෙන්වා ගැනීමට හැකියාවක් නොතිබුණේ ඉන්දීය සාගර කලාපයේ බලය ද ඒ වන විට ප්‍රබල චෝල අධිරාජ්‍යය සතුව පැවති නිසාය. ඒ වන විට දකුණු ඉන්දියාවේ දේශපාලන බලය අතින් ප්‍රබල තත්වයක පැවැති චෝල පාලනයට එරෙහිව ලංකාවට ආධාර කරන්නට කලාපීය රටක් ඉදිරිපත් වීමට ඇති හැකියාව ද අවමය. අනුරාධපුර රාජ්‍යය චෝල පාලනයට පත් වීමත් සමඟ ලංකාවේ භික්ෂූන් වහන්සේලා සැලකිය යුතු ප්‍රමාණයක් බුරුමයට වැඩම කර ඇත. බුරුම රාජ්‍යය එක්සේසත් කරමින් සමස්ථ රාජ්‍යම ථේරවාදී බෞද්ධ රජ්‍යයක් බවට පත්කරන්නේ අනවරත හෙවත් අනුරුද්ධ (ක්‍රි.ව. 1044-1077) රජතුමාය. (Harvey, 1925, p. 23) උතුරු බුරුමයේ පාලකයා වූ අනුරුද්ධ රජු දකුණු බුරුමයද යටත් කරගනිමින් බුරුමයේ බලය

තහවුරු කරගෙන තිබේ. ශ්‍රී ලංකාවෙන් බුරුමයට ආ ගිය භික්ෂූන් වහන්සේලා මගින් බුරුමයේ දේශපාලනික තත්වය පිළිබඳ මනා අවබෝධයක් විජයබා රජු ලබන්නට ඇත.

විජයබා රජු බුරුමයේ අනවරත රජුට බොහෝ ධනය සමගින් දූත පිරිසක් යැවීමෙන් අනතුරුව බුරුම රජු විසින් විවිධ භාණ්ඩයන්ගෙන් සමන්විත නැව් සමූහයක් ලංකාවට එවා ඇත. එම නැව් සමූහය විසිතුරු වස්ත්‍ර, කපුරු, සඳුන් ආදී භාණ්ඩයන්ගෙන් සමන්විතව තිබී ඇත. මහාවංශයේ සඳහන් වන මෙම පුවතින් ගම්‍ය වන්නේ විජයබා රජු බුරුමයට ධනය යවා එකල රුහුණු රට දුර්ලභ වූ භාණ්ඩ ආනයනය කර ඇති බවය. ඒ වන විටත් ලංකාවේ ප්‍රධාන වෙළඳ තොටවල් හා ජාත්‍යන්තර වෙළඳාමේ බලය සොලීන් සතු වූ හෙයින් රුහුණට අවශ්‍ය භාණ්ඩ ආයනයනය අතිශයින්ම සීමා වන්නට ඇත. මහාවංශ ප්‍රකාශය අනුව පෙනී යන්නේ රජු මෙම පියවර ගෙන ඇත්තේ තම සේනාව සතුටු කිරීමට මෙන්ම සේනාව වර්ධනය කර ගැනීම සඳහා උපක්‍රමයක් ලෙසය. අනතුරුව රජු මහත් සේනා ඇතිව තම්මල නම් ගමෙහි වාසය කළ බැව් මහාවංශය පවසයි. (මහාවංශය, 256 පිටුව). ඇතැම් විට මෙම විශාල භාණ්ඩ තොග යෙන් කොටසක් විකිණීමෙන් ලද ආදායම තම සේනාවේ වර්ධනය සඳහා ද යොදවන්නට ඇත. චෝල ආක්‍රමණිකයන් නිසා රජරට විහාරාරාමයන්හි වැඩ විසූ භික්ෂූන් වහන්සේලා රුහුණට වැඩම කළ අතර බොහෝ භික්ෂූන් වහන්සේලා බුරුමය ආදී බෞද්ධ රටවල් කරා වැඩම කර ඇත. මෙම භික්ෂූන් වහන්සේලා මාර්ග යෙන් බුරුම රජු අනුරාධපුර නගරයේ බෞද්ධ විහාරස්ථානයන්ට අත්ව ඇති ඛේදජනක ඉරණම එනම්, චෝල පාලකයන් වෙහෙර විහාරාරාම කඩා බිඳ දමා වස්තුව මංකොල්ල කා හින්දු කෝවිල් ඉදිකරමින් බුද්ධ ශාසනයට කරන්නා වූ අනේක විධ හානි පිළිබඳ තොරතුරු අසා බුරුම රජු චෝලයන්ට විරුද්ධව සටන් කරන විජයබා රජුට උදවු කරන්නට අදහස් කළා විය හැකිය. එමෙන්ම චෝල වෙළඳ අධිකාරියේ අයබදු, අතීතයේ පටන් මුහුදු වෙළඳ මාර්ගයේ පිහිටි ප්‍රධාන රාජ්‍යයක් වූ බුරුම දේශයේ ආර්ථිකයට ද බලපාන්න ඇත.

චෝල පාලනය අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සුදානම් කරමින් සිටි විජයබාහු රජු යුද්ධ කිරීමට ආසන්න සමයේ බුරුමයට නැව් යවා අනවරත රජුගෙන් යුධ ආධාර ඉල්ලා ඇත. (Harvey, 1925, p. 23) බුරුම රජු මෙම අවස්ථාවේ රජුට සහාය දක්වා ඇතත් එම යුද භටයන් රැගත් නැව් ලංකාවට පැමිණීමට මත්තෙන් විජයබා රජු යුද්ධය ජයග්‍රහණය කර ඇත. චෝලයන් පන්නා රට එක්සේසත් කළ රජුට අනතුරුව බෞද්ධ ශාසනය නැවත යථා පරිදි ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය ඇති වේ. ඒ වන විට උපසම්පදා කර්ම කිරීමට අවශ්‍ය භික්ෂූන් වහන්සේලා පස් නමක්වත් සොයා ගත නොහැකි වූ බව පූජාවලියයේ සඳහන් වේ. (පූජාවලිය, 782 පිටුව). මහාවංශයෙහිද සඳහන් වන්නේ උපසම්පදාකර්ම සිදුකිරීමට ගණ පූරක භික්ෂූන් වහන්සේලා ප්‍රමාණයක් නොසිටි බවය.[25] අනතුරුව විජයබා රජු තම මිතුරු වූ රාමඤ්ඤ දේශයේ රජුට දූතයන් අත පඬුරු යවා එරටින් ත්‍රිපිටක පාරගත ශීලාදී ගුණයන්ට ආවාස වැනි වූ භික්ෂූන් වහන්සේලා (පුජාවලිය, 782 පිටුව). වැඩම කරවා උපසම්පදා කර්ම කර තුන් පිටකය දේශනා කරවා ලංකාව තුළ නැවත බුද්ධ ශාසනය බබළබා ඇත. වේළයික්කාර සෙල්ලිපියෙහිද අරමන දේශයෙන් භික්ෂූන් වැඩම කරවා තුන් නිකාය පවිත්‍ර කර වූ බව සඳහන් වේ. (Wickremasinghe, 1928, p. 246) සාසනවංශයේ මෙම සිදුවීම දක්වා ඇත්තේ,

"අනුරුද්ධ රජු මහායෝධයන් හතර දෙනෙක් සිංහලද්විපයට යවා ත්‍රිපිටකය ගෙන්වා ගත්තේය. සිංහලද්වීපයෙන් ගෙන්වා ගත් ත්‍රිපිටකයන් හා සුධම්මපුරයෙන් ගෙන්වා ගත් ත්‍රිපිටකයන් එකිනෙකට සංසන්දනය කරවා අරහත් තෙරුන් විමසිය."

මෙම සිදුවීම මුලාශ්‍රයන් තුළ විවිධාකාරයෙන් විස්තර කර තිබීම විශේෂත්වයකි. ජිනකාලමාලියෙහි සඳහන් වන්නේ අනවරත රජු ලංකාවට පිරිසක් සමඟ සපැමිණ ත්‍රිපිටකය ද නිරුක්තිපිටකයද ලියවාගෙන ගිය බවය. නමුත් මේ පිළිබඳ මහාවංශය හෝ වෙනත් ලාංකේය මුලාශ්‍රයක සඳහන් නොවීම විශේෂත්වයකි.

බුරුම මූලාශ්‍රයන්ට අනුව, විජයබා රජු චෝලයන් පන්නා දමා ශාසනය ශෝධනය කරනු වස් බුරුම රජුගෙන් ඒ සඳහා භික්ෂූන් වහන්සේලා ඉල්ලා පණිවිඩ යවා ඇත. අනුරුද්ධ රජු එම ඉල්ලීම ඉතාමත් හරසරින් පිළිගෙන අවශ්‍ය ධර්මධර භික්ෂූන් වහන්සේලා ද සමඟින් සිය මිත්‍ර විජයබා රජුට තෑගි වශයෙන් ධවල වර්ණ ඇතෙක් ද එවා ඇත. ඒ සමඟින් අනුරුද්ධ රජු විජයාබා රජුගෙන් ඉල්ලා ඇත්තේ දන්ත ධාතූන් වහන්සේ සිය රාජ්‍යයට ලබා දෙන ලෙසය. අනතුරුව එම ඉල්ලීම ඉටු කරනු වස් විජයබා රජු දන්ත ධාතූන් වහන්සේගේ අනුරුවක් නිර්මාණය කර රත්රන් මංජුසාවක තැන්පත් කර රාමඤ්ඤ දේශයට පිටත් කර යවා ඇත. එම දන්ත ධාතූන් වහන්සේගේ අනුරුව රැගත් නෞකාව මුහුදු තීරය තරණය කොට බුරුමයේ ඉරවඩී ගංගාව ඔස්සේ පගාන් නගරය ආසන්නයට පැමිණ ඇත. ගං ඉවුරට සැපත් වූ අනුරුද්ධ රජු ප්‍රීතියෙන් පිනා ගොසින් කරවටක් දක්වා වතුරේ බැස දන්ත ධාතූන් වහන්සේ පිළිගෙන හිස මතින් වැඩමවා ඇත. පසුව රජු විසින් ක්‍රි.ව. 1059 දී පමණ ඉදිකිරීම් ආරම්භ කරන ලද ස්වේජිගොන් චෛත්‍යයේ මෙම දන්ත ධාතූන් වහන්සේගේ අනුරුව තැන්පත් කර ඇත. එම චෛත්‍යයේ තථාගතයන් වහන්සේගේ අකු ධාතූන් වහන්සේ නමක් ද නිධන් කර ඇති බව විස්වාස කරයි. (Harvey, 1925, p. 23). චෛත්‍යයේ වැඩ අවසන් කිරීමට පෙර අනුරුද්ධ රජු මිය යන අතර චෛත්‍ය කර්මාන්තය නිමාවට පත් කරන්නේ ඔහුගෙන් අනතුරුව බලයට පත්වන ඔහු පුත් කෙයන්සිත්ථ රජුය (ක්‍රි.ව. 1086-1112). මහාවංශයේ සඳහන් නොවන බුරුම වංශකථාවන්හි සඳහන් වන පුවතක් වන්නේ පළමුවන විජයබා රජු කෙයන්සිත්ථ රජු වෙත ධාතූන් වහන්සේලා නව නමක් පරිත්‍යාග කිරීම පිළිබඳ පුවතයි.

විජයබා රජු අසල්වැසි රාජ්‍යයන් සමඟ මිත්‍රශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ශ්‍රී විජය රාජ්‍යය හෙවත් කලිඟු රජ පරපුරට අයත් ඉතා රූමත් කුමාරිකාවක් වූ තිලෝකසුන්දරී කලිඟු රටින් ගෙන්වා රජු සිය මෙහෙසි තනතුරේ අභිෂේක කර ඇත. එමෙන්ම සිය නැගණිය වූ මිත්තා කුමරිය පාණ්ඩ්‍ය දේශයේ රජ කුමරෙක්ට සරණ පාවා දී ඇත. රජු අසල්වැසි රාජ්‍යයන්

සමග විවාහ සම්බන්ධතා පවත්වා ගනිමින් සිය රාජ්‍යයේ ආරක්ෂාව වඩාත් තහවුරු කරගෙන තිබේ. කර්ණාටක රජු හා සොලී රජු විසින් පඬුරු හා රාජ දූතයන් සතුටු සිතින් පිළිගත් රජු එම දෙරටට ද දූතයන් පිටත් කර ඇත. ඉන් සොලී රටට ගිය සිංහල දූතයන්ගේ කන් නාසාදිය කපා විකෘති තත්වයට පත් කර ඇති බව මහාවංශයේ සඳහන් කර ඇත. රජු සොලී රජුට දෙරටේම සේනාවන්ගෙන් තොරව මහ මූද මැද ද්වන්ධ සටනක් කිරීමට කැමැත්ත ප්‍රකාශ කර සොලී දූතයන්ට ස්ත්‍රී වස්ත්‍ර අන්දවා පිටත් කර ඇත. අනතුරුව සොලී රට ආක්‍රමණය කිරීමට සූදානම් වූ අවස්ථාවේ වේළක්කාර සේනාව සොලීන් හා යුද්ධ කිරීමට විරුද්ධව අභ්‍යන්තර ආරවුලක් නිර්මාණය කළ හෙයින් සොලී රට ආක්‍රමණය ව්‍යාර්ථ විය. පෙර දවස සොලීන් ලංකාව ආක්‍රමණය කර වෙහෙර විහාර විනාස කරමින් ඔවුන්ගේ ආගමික ස්ථාන ගොඩනැගුව ද විජයබා රජු ඒ සියල්ල ආරක්ෂා කිරීම විශේෂත්වයකි. සිංහල ජාතියේ අනන්‍යතාවය ආරක්ෂා කළ විජයබාහු රජු ලාංකේය ඉතිහාසයේ පහළ වූ අසමසම නරපතියකු වශයෙන් අවිවාදයෙන් සැළකිය හැකිය.

### මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ විදේශ සබඳතා

ලංකාද්වීපයම එක් ධජයක් යටතට ගෙන ආ පළමුවන විජයබාහු රජුගෙන් පසු මහා පරාක්‍රමබාහු රජු රාජ්‍යත්වයට පත්වන තෙක් (ක්‍රි.ව. 1110-1153 අතර කාලය) පොළොන්නරු රාජ්‍යය අභ්‍යන්තර දේශපාලන අරගලයන්ගෙන් සමන්විත කාල පරිච්ඡේදයක් විය. මහාවංශයට අනුව විජයබාහු රජුගේ පුත් වික්‍රමබාහු කුමරුට හිමිවෙන්නට තිබූ රාජ්‍ය උරුමය විජයබා රජුගේ සොහොයුරිය වූ මිත්තාගේ දරුවන්ට ලැබෙන ආකාරයෙන් කටයුතු සිද්ධ වීමෙන් සිදු වූයේ ලංකාව රාජ්‍යයන් කිහිපයකට වෙන්ව පාලනය වීමය. අනතුරුව ක්‍රි.ව. 1153 දී රාජ්‍යත්වයට පත්වන මහා පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය අවධිය ලංකා ඉතිහාසයේ ස්වර්ණමය කාල පරිච්ඡේදය වශයෙන් සැලකේ. පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය ප්‍රතිපත්තීන් අතිශයින් දූරදර්ශීය. රට එක්සේසත් කිරීමට ප්‍රථමයෙන්, එතුමාගේ මූලික අභිප්‍රාය වන්නේ ආහාරයෙන්

ස්වයංපෝෂිත වීමයි. සියල්ලට පළමු කොට බෙහෙවින් ධාන්‍ය රැස් කළ යුතු යැයි සිතා, "වැස්සෙන් හටගන්නා ජලයෙන් ප්‍රයෝජනයක් නොගෙන මුහුදට ගලා නො යේවා" (මහාවංශය, 297 පිටුව). යන අදහස සිතැතිව එතුමා කටයුතු කර ඇත. පරාක්‍රමබාහු රජුගේ සුවිශේෂී ආර්ථික ප්‍රතිපත්තීන් හේතුවෙන් ලංකා රාජ්‍ය බෙහෙවින් සමෘද්ධියට පත් විය. එමෙන්ම එතුමාට තත්කාලීන අසැල්වැසි රාජ්‍යන්ට අභියෝග කළ හැකි ආරක්ෂක බලයක් තිබූ බව ද වංශකථා තුළින් අනාවරණය වේ.

පරාක්‍රමබාහු රජු කුමාර අවධියේ විදේශයන් කරා ගොස් බොහෝ ශාස්ත්‍ර ප්‍රගුණ කර ඇත. මහාවංශයේ සඳහන් වන පරිදි වෛද්‍ය ශාස්ත්‍රය, තර්ක ශාස්ත්‍රය, ව්‍යාකරණ, කාව්‍ය ශාස්ත්‍රය, සංගීතය, හස්ති දමනය, අශ්ව දමනය ආදී තත්කාලීනව පැවති සකළ ශිල්පයන්ගේ පරතෙරට පැමිණ ඇත. විශේෂයෙන්ම රජතුමා චාණක්‍ය නම් බ්‍රහ්මණයාගේ නුවණ සම්බන්ධයෙන් කරන ප්‍රකාශයෙන් පෙනී යන්නේ රජු චාණක්‍යයන්ගේ අර්ථශාස්ත්‍රය පිළිබඳ දැනුවත් බවය. එතුමාගේ පාලන කාලය දෙස අවධානය යොමු කිරීමේදී ආර්ථික, දේශපාලන, විදේශ සබඳතා, රාජ්‍ය පරිපාලනය, පාලන කටයුතු හා නීතිය ආදිය පිළිබඳ හසල දැනුමක් තිබූ බව නිසැක වශයෙන්ම ගම්‍යමාන වේ. තමාට අයිති ප්‍රදේශයන්ගේ නිදහස ස්ථිර වූවායින් පසු මෙතුමා සිය මුතුන් මිත්තන් මෙන් කීර්තිය නොදෙන සුළු විශ්‍රාමයෙන් නිදහස් සුව නොවින්දේය. (මලලසේකර, 2014, 125 පිටුව). පරාක්‍රමබාහු රජු තමන්ගේ සියලු ශක්තිය දේශයේ අභිවෘද්ධිය වෙනුවෙන් කැප කර ඇත. රජු රටේ ආරක්ෂාව කොතරම් ශක්තිමත් කළා ද යත් එසමයෙහි, මාණික්‍යයක් අතින් ගත් ස්ත්‍රියකට පවා එය කුමක්දැයි කිසිවෙකු විසින් නොම විමසනු ලැබ දිවයිනේ ඕනෑම තැනකට යාමට හැකියාව තිබී ඇත.අතැම් අවස්ථාවන්හිදී රජු කිසියම් කාර්යක් ඉටු කිරීමට අමාත්‍යවරුන්ට නියෝග කළ විට, ඔවුන් එම කාර්ය සිදු කිරීමේදී මතුවන දුෂ්කරතා රජුට පෙන්වා දුන් විට රජු ප්‍රකාශ කර ඇත්තේ. "ලෝකයේ උත්සහවත් මිනිසුන් හට කළ නොහැක්කේ කුමක් ද ? රාම තෙමේ සයුරෙහි වඳුරු සමූහයක් ලවා මහ වේල්ලක් බැන්ද වී ය." යනුවෙනි.

(මහාවංශය, 298 පිටුව). රජතුමා තම ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමේදී දැඩි ස්ථාවර අරමුණක සිටි බව පැහැදිලිය. එතුමාගේ කර්තව්‍යවන්හි එල ප්‍රයෝජන වර්තමාන ලක් ජනතාව ද භුක්ති විදිති.

පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ බුරුම දේශය සමඟ යුද්ධයක් ඇති විය. එයට හේතු වූ කාරණය නිශ්චිතවම කිව නොහැකි වුවත් මහා වංශයට අනුව එකල බුරුම රජතුමාගේ නොමනා ක්‍රියා කලාපය ඒ සඳහා හේතු කාරණා වී තිබේ. බුරුමය හා ලංකාව යන දෙරටටම බුදු දහම ලැබීම පිළිබඳ අතීතය තපස්සු-භල්ලික වෙළඳ දෙබෑයන් දක්වා දිවයයි. (මහාවග්ගපාළි, 09 පිටුව) දෙරට අතර ඉතිහාසයේ වරින් වර සම්බන්ධතා පැවති අතර එම සබඳතා වඩාත් තහවුරු වන්නේ අනවරත රජු හා විජයබාහු රජ දවසය. මහාවංශය පවසන පරිදි, සම්‍යග්දෘෂ්ටි සමගි මිනිසුන්ගේ නිවස බැවින් ලංකා රාමඤ්ඤ දේශයන්ගේ භේදයක් කිසි කලකත් නොවී ය. දෙරටේ පාලකයන් ඉතා අවබෝධයෙන් හා සමගියෙන් කටයුතු කළ අතර වරින් වර රාජ දූතයන් උනුන් වෙත පමුණුවමින් ඉතා වටිනා පඬුරු හුවමාරු කරගෙන තිබේ. කාලයක් තිස්සේ දෙරට අතර වෙළඳ සබඳතා පැවති අතර ඒ හා සම්බන්ධව චිරානුගත චාරිත්‍ර සකස් වී තිබී ඇත.

බුරුමය හා ලංකාව අතර පැවැති මිත්‍රත්වයට බලවත් ලෙස හානිදායක වූ යුද්ධයක් පිළිබඳ මහාවංශය ඇතුලු ලාංකේය වංශකථාන්හි මෙන්ම බුරුම වංශකථාවන්හි ද සඳහන් වේ. බුරුමයේ අලෞසිථූ (ක්‍රි.ව. 1112-1167) රාජ්‍ය සමයේ (Harvey, 1925, p. 23) ඇති වූ මෙම යුද්ධයට හේතුව වශයෙන් ලාංකේය වංශකථාවන්හි සඳහන් වන්නේ දෙරට අතර වෙළඳාම පිළිබඳ වූ ප්‍රවේණිගත චාරිත්‍රයන් උල්ලංඝනය කිරීම හා ලංකාවෙන් කාම්බෝජය කරා ගමන්ගත් දූත පිරිසකට බුරුම රජු හිරිහැර කිරීමත්ය. ප්‍රථමයෙන් බුරුම රජු විසින් ලංකාවෙන් පැමිණෙන දූතයන්ට දෙනු ලබන්නා වූ පඬුරු ආදිය දීම පැහැර හරිනු ලබන අතර චාරිත්‍රයක් වශයෙන් ලංකාවෙන් පැමිණෙන නැවක් සඳහා දෙනු ලබන්නා වූ ඇත් පඬුර ද දීම අත්හිටුවා ඇත. ඇතෙක්

විකුණන මිල රිදී සියය හෝ වැලි දහස පූර්වයේ නියමව තිබූ මිල විය. මෙම මිල බුරුම රජු ක්‍රමයෙන් දෙදහස, තුන්දහස දක්වා ඉහල දමා ඇත. එකල්හිම ලංකා රාජ්‍යයේ සිට කාම්බෝජය බලා යන දූත පිරිසකගේ වස්තූන් පැහැර ගෙන බලකොටුවක සිර කර ඇති අතර ඔවුන්හට කටුක වද හිංසාවන් පමුණුවා ඇත. වාගීස්වර නම් ආචාර්යන් ද ධර්ම කිර්ති නම් පඬිතුමාවද සිදුරු සහිත නැවක නංවා ඇත. ඇතුන් මිල දී ගැනීම පිණිස ලංකාවෙන් පැමිණෙන වෙළඳුන්ට බොරු කියා මුදල් ගනිමින් ඇතුන් නොදී සිටියහ. මෙකල පරාක්‍රමබාහු රජු විසින් කාම්බෝජය බලා යවන ලද රාජ කුමාරිකාවක් ද බුරුම රජු විසින් පැහැර ගෙන ඇත. සිංහල දේශයෙන් සිය දේශයට නැවත නැව් නො එවිය යුතු යැයි තර්ජනය කර ඇත. (මහාවංශය, 366 පිටුව).

උක්ත සිදුවීමට හේතුපාදක වූ කරුණු කාරණා සවිස්තරව මුලාශ්‍රයන් තුළ සඳහන් නොවේ. මහාවංශය දක්වන පරිදි ලංකාවෙන් බුරුමය කරා ගිය දූතයකු විසින් දෙන ලද කිසියම් වැරදි තොරතුරක් (කේලමක්) බුරුම රජුගේ කනේ තැබීම මෙම නොමනා ක්‍රියාවන්ට හේතු වී ඇත. බුරුමයේ හම්නාම් යාෂාවින් නම් වංශකථාවෙහි අලෞංසිථූ රජු ලංකාවට පැමිණ අවස්ථාවේ ලංකාවේ පාලකයා සිය දියණිය ඔහුට සරණ පාවා දී මිනිසුන් අට සියයක් ද තෑගි වශයෙන් ලබා දුන් බව සඳහන් කර ඇත. එහෙත් එවැනි සිදුවීමක් වෙනත් මුලාශ්‍රයක සඳහන් නොවන අතර එවැනි සිදුවීමක් සිද්ධ වූයේ නම් මහාවංශය හෝ වෙනත් ලාංකේය මුලාශ්‍රයක් එම පුවත වාර්ථා නොකරන්නට ද හේතුවක් නොමැත. කෙසේ නමුත් බුරුම රජු දෙරට අතර වූ චිරාගත සම්ප්‍රදායන්ට එරෙහිව යන්නට විශේෂිත හේතුවක් නිසැක වශයෙන්ම තිබිය යුතුය. බලපරාක්‍රමයෙන් යුත්ත වූ පරාක්‍රමබාහු රජු මෙම සිදුවීම් දැන මහත් සේ උරණව සේනාව කැඳවා බුරුම රජු මරා දැමීමට හෝ අල්ලා ගැනීමට නියෝග කර ඇත. රජු මෙසේ නියෝග කරනවාත් සමඟ ආදිත්‍ය ද්‍රවිඩාධිකාරි නම් මහ ඇමතිවරයෙක් රජුගෙන් ඉල්ලා ඇත්තේ තමන් හට ඒ කාර්ය සඳහා යාමට අවසර දෙන ලෙසය. රජු සතුටුව ඔහුට බුරුමය හා යුද්ධ කරනු පිණිස යෑමට අවසර ලබා දී ඇත.

යුද්ධය පිළිබඳ අත්දැකීම් බහුල රජු විසින් වහා වහා නැව් සම්පාදනය කරන්නට නියෝග කර ඇත්තේ තවත් භට පිරිසක් බුරුම ආක්‍රමණය උදේසා යැවීමටය. රජුගේ නියෝග යෙන් අනතුරුව මාස පහක් පුරා නැව් සකස් කිරීම කළ අතර, මහාවංශයේ දක්වෙන්නේ එම කාලය මුහුදුබඩ ප්‍රදේශය එකම කර්මාන්ත ශාලාවක් බඳු වූ බවය. නැව් කර්මාන්තය අවසන් වූ පසු වසරක් සඳහා අවශ්‍ය කරන සහල්, ආයුධ, සන්නාහ, විවිධ ආකාරයෙන් ශරීරයට විෂ ඇතුල් වූ විට අවශ්‍ය කරන්නා වූ බෙහෙත් බෙහෙත් ද, අනෙකුත් බෙහෙත් වර්ගද. ඉතා දක්ෂ වෙදුන් ද ආහාර පිළිවෙල කිරීම උදෙසා කාන්තාවන් ද තවත් අවශ්‍ය කරන්නා වූ ගමන් පහසුකම් ද සපයා යුද්ධයේ ඉතා තීක්ෂණ බුද්ධි ඇති කිත්නුවරගල් හෙවත් කීර්ති නගර ගිරි නම් මහ සෙනෙවියා සමගින් බල ඇණියක් බුරුමය අල්ලාගනු පිණිස පිටත් කර ඇත. මෙම නැව් පිටත් වන විට දිවයිනක් මහ මුහුදේ ගමන් කරන විලාසයකින් දිස් වූ බැව් මහාවංශය විස්තර කරයි. එම නැව් සමූහයෙන් කොටසක් මුහුදේදී කුණාටුවකට හසුව විනාශ මුඛයට පත් වන අතර එක් නැවක් කාක දිවයිනට ගොඩබා ඇත.

කිත් නුවර ගල් ප්‍රමුඛ සේනාව බුරුමයේ කුසුම්තොට නම් වරායට ගොඩ බසින අතර ආදිත්‍ය ද්‍රවිඩාධිකාරීන්ගේ සේනාව පප්පළා නම් වරායට ගොඩ බැස ඇත. මෙම ලාංකේය බට පිරිස බුරුමය සිය ග්‍රහණයට නතු කරගන්නා අතර, දෙරටේ භික්ෂූන් වහන්සේලාගේ සම්බන්ධතා ඇසුරු කොට ලංකාවේ නිකායත්‍රය වාසී භික්ෂූන්ගේ ඉල්ලීම් අනුව පරාක්‍රමබාහු රජු බුරුම රාජ්‍ය සිය ග්‍රහණයෙන් මුදවා ඇත. එහෙත් බුරුම රාජ්‍යය අවුරුදු පතා ලංකා රාජ්‍යයට ඇතුන් එවන්නට ගිවිසුම් ගතව ඇත. (මහාවංශය, 368 පිටුව). මෙම කාලය ක්‍රි.ව. 1065 යැයි පරාක්‍රමබාහු රජුගේ රාජ්‍යත්වයෙන් දොළොස් වන වසරේ දෙවනගල පිහිටුවන ලද ශිලා ලේඛනයේ සඳහන් වේ. (Wickremasinghe, 1928, p. 246). එහි සඳහන් වන්නේ එම යුද ජයග්‍රහණය වෙනුවෙන් රජු විසින් කිත් නුවර සෙනෙවි භට ප්‍රධානය කරන ලද පරප්‍රසාදයන් පිළිබඳවය. ඉන්දියාවේ මධුරා පුරය කුලසේකර නම් රජු ආක්‍රමණය කර එහි රජු වූ පරාක්‍රම නම් රජු මරා රජය පැහැර ගත් අතර පරාක්‍රමබාහු

රජු තම මිත්‍ර දේශයට වූ විපත දැක වහ වහා සේනා සංවිධානය කොට පඬි රාජ්‍යය නැවත පිහිටුවන්නට බල සේනා යවා ඇත. (මහාවංශය, 369 පිටුව). මෙම පිරිස දකුණු ඉන්දියාවේ විශාල කොටසක බලය අත්කරගත් බැව් මහාවංශයේ දැක්වේ.

බුරුමයේ කෙයන්සිත්ථ රජු අධ්‍යාපනය නඟා සිටුවන්නට මහත් වෙහෙසක් ගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් බුරුම භික්ෂූන් වහන්සේලා විසින් ධර්ම ග්‍රන්ථ රචනා කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව බුරුම සාහිත්‍යයේ නව පුනරුදයක් ඇති විය. පගාන් රාජ්‍යයේ පාලි අධ්‍යාපනය දැඩි ලෙස මුල් බැස ගත් අතර බුරුම භික්ෂූන් වහන්සේලා අභිධර්මයේ හා ව්‍යාකරණයේ විශේෂඥයන් වූ බව මෙකල රචිත ග්‍රන්ථයන්ගෙන් තහවුරු වේ. (ශ්‍රී ලංකාවේ පාලි සාහිත්‍යය, 133 පිටුව). අලෞසිථූ රාජ්‍ය සමයේ බුරුමයේ අග්ගවංස හිමියන් සද්ද නීති නම් ව්‍යාකරණ ග්‍රන්ථයක් සකස් කොට ඇත. මෙම පාලි ව්‍යාකරණ ග්‍රන්ථය මහා විහාරයට පිරිනැමීම සඳහා එවකට බුරුමයේ ප්‍රධාන සංඝනායක හිමියන් වශයෙන් වැඩ සිටි උත්තරාජීව හිමියන් තවත් සංඝයා වහන්සේලා පිරිසක් සමඟින් ක්‍රි.ව. 1180 දී පමණ ලංකාවට වැඩම කර ඇත. (Harvey, 1925, p. 23). මෙම පිරිස පැමිණි කාලය සම්බන්ධයෙන් දෙරටේ වංශකථාවන් තුළ දක්වා ඇති කාල වකවානුන්හි විෂමතා දැකිය හැකිය. උත්තරාජීව හිමියන් නරපතිසිථූ රජුගේ අනුශාසකයෙක් යැයි කළ්‍යාණි ශිලා ලේඛනයේ සඳහන් කර ඇත. මෙම පිරිස හා පැමිණ තලෙයින් ජාතික ඡප්පට නම් සාමණේර හිමියන්ගේ උපසම්පදා පිංකම දෙරටේම භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වයෙන් මහවැලි ගංගාවේ පහුරක් මත ඉඳි කරන ලද මන්දිරයක සිදු කර ඇත. මහනායක හිමියන් ඇතුළු පිරිස කෙටි කාලයක් ලංකාවේ සිද්ධස්ථාන වන්දනා කිරීමෙන් අනතුරුව නැවත සිය රට බලා පිටත්ව ගිය ද ඡප්පට හිමියන් මහාවිහාරයේ ධර්මාධ්‍යාපනය සඳහා නැවති තිබේ.

ඡප්පට හිමියන් දසර දහයක පමණ කාලයක් ලංකාවේ අධ්‍යාපනය හැදෑරීමෙන් අනතුරුව මහාවිහාරීය භික්ෂූන්ගෙන් සද්ධර්ම ජෝතිපාල නම් ගෞරව නාමය ලබා සිය

දේශය බලා පිටත්ව යන්නේ තවත් භික්ෂූන් වහන්සේලා ද කිහිප නමක් සමඟිනි. එම පිරිසට කාංචිපුර වැසි ආනන්ද හිමියන් ද ත්‍රාමලිප්ත වැසි සීවලී හිමියන් ද කාම්බෝජ රජුගේ පුත්‍රයෙක් වූ තාමලින්ද හිමියන් ද (Harvey, 1925, p. 23) පිටක ධර්මය පිළිබඳ මනා අවබෝධයකින් හෙබි ලාංකේය භික්ෂුවක් වූ රාහුල හිමියන් ද ඇතුලත් විය. ඡප්පට හිමියන් ඇතුලු භික්ෂූන් වහන්සේලා බුරුමයට ගොස් සීහල සංඝ නිකාය නමින් නව නිකායක් ස්ථාපිත කරන්නේ ලංකාවේ උපස්මිපදාව බුරුම උපසම්පදාවට වඩා උසස් යැයි පවසාය. ඡප්පට හිමි රජුගේ අනුග්‍රහය ඇතුව ඉරවඩි ගඟේ පහුරක් මත මෙම උපසම්පදා පිංකම පවත්වා ඇත. ඡප්පට හිමියන්ගේ ක්‍රියාව එරට සංඝ සංස්ථාව දෙකඩ වීමට හේතු වී ඇත. ඡප්පට තෙරුන්ගේ අපවත් වීමෙන් අනතුරුව ලංකාවේන් වැඩි භික්ෂූන් වහන්සේලා විනය හේතු මත පදනම්ව වෙන වෙනම නිකායන් බිහි කර ගෙන ඇත. මේ පිරිස අතරින් රාහුල හිමියන් මලය දේශයට ගොස් එහිදි උපැවිදි වී තිබේ. ඡප්පට හිමිගේ අපවත් වීමත් රාහුල හිමියන්ගේ උපැවිදි වීමත් සීහල සංඝ නිකායේ භේදයන්ට හේතු වන්නට ඇත. මෙම පුවතින් අනාවරණය වන වැදගත් කාරණයක් වන්නේ එකල මහාවිහාරයේ අධ්‍යාපනය ලැබීමට නෙක නෙක දේශයන්ගෙන් භික්ෂූන් වහන්සේලා පැමිණ ඇති බවය. එකල කාම්බෝජය වැනි බලවත් රටවල රාජ කුමාර වරුන් ද මෙම පිරිස් අතර සිටීම විශේෂත්වයකි. ඉන් ගම්‍ය වන්නේ වංශකථා තුළ වාර්ථාගත නොවුනද ලංකාව හා තත්කාලීන ලෝකයේ බොහෝ රටවල් සමඟ සබඳතා පවත්වා ඇති බවය.

පරාක්‍රමබාහු රාජ්‍ය සමය ලංකා ඉතිහාසයේ සුවිශේෂී රාජ්‍ය සමයක් වන අතර එකල ලංකාව ඉතාම ධනවත් ආර්ථිකයකින් හෙබි රටක් වූ නිසා, වෙළඳ සබඳතා හා තානාපති සබඳතා ලෝකයේ බොහෝ රටවල් සමඟ පවත්වා තිබුණු බවට සාධක විදේශීය හා දේශිය මුලාශ්‍රයන් තුළ දැකිය හැකිය. පරාක්‍රමබාහු රජ දවස ලංකා රාජ්‍යය ධන ධාන්‍යයෙන් ආඪ්‍යව පැවති සමයකි. එසමයෙහි බොහෝ විදේශ රටවල් ලංකාව සමඟ සබඳතා පැවැති බව දේශීය හා විදේශීය මුලාශ්‍රයන් තුළ තොරතුරු අන්තර්ගත වේ. පරාක්‍රමබාහු රජුගෙන් පසු පොළොන්නරු රාජ්‍යයේ බලයට පත් වූ

ප්‍රබල පාලකයෙක් වශයෙන් නිශ්ශංකමල්ල රජු හැඳින්විය හැකිය. එතුමාගේ රජ්‍ය කාලය තුළ ගුජරාටය, පාණ්ඩ්‍ය රාජ්‍යය, මයිෂූර් රාජ්‍යය, චෝල රාජ්‍යය, කාලිංගය, බුරුමය ආදි බොහෝ රටවල් සමඟ සබඳතා පැවැත්වූ බවට තොරතුරු හමුව ඇත. (Mendis, 1940, p.115). එතුමාගේ රාජ්‍ය කාලය වර්ෂ නවයකට පමණක් සීමා වන අතර ඉන් අනතුරුව පොළොන්නරුව රාජධානියෙන් ප්‍රබල පාලකයෙක් බිහි නොවීම පොළොන්නරුව රාජධානිය ද අනුරාධපුර රාජධානිය මෙන් ලංකාවේ පැවති දෙවැනි රාජධනිය ලෙස අතීතයට එක් වීමට හේතු විය. ඒ සඳහා කාලිංසයේ මාඝ නම් කුමාරයා ලංකාව ආක්‍රමණය කර පොළොන්නරුව පාලනය කිරීම විශේෂයෙන් ම හේතු විය.

**සමාලෝචනය**

මහවැලි ගං දියෙන් සරුසාර වන පොළොන්නරුව වර්තමානයේ ද දෙස් විදෙස් සංචාරකයන්ගේ තෝතැන්නකි. ලාංකේය ඉතිහාසය තුළ පොළොන්නරුව රාජධානිය ශතවර්ෂ දෙකකට පමණ සීමා වුව ද එම කාල පරාසයෙන් වර්ෂ අනූවක් පමණ පාලනය කරන්නේ පළමුවන විජයබාහු හා මහා පරාක්‍රමබාහු යන සුවිශේෂී රජවරුය. මෙම රජවරුන්ගේ කාල සමයෙහි ලංකාව ලෝකයේ ඉතා ප්‍රභල රටක් බවට පත් වන්නේ ආර්ථිකමය වශයෙන් පමණක් නොව යුදමය වශයෙන් ද ඉතා ශක්තිමත් වූ නිසාය යන්න වංශකථා හා ශිලා ලේඛනයන්ගෙන් විෂද වේ. මේ අතරින් විජයබාහු රජු විදේශ රටවල් සමඟ ඉතා මිත්‍රශීලී සබඳතා පැවැත් වූ පාලකයෙකි. එතුමා ආගමික හා දේශපාලන වශයෙන් බුරුමය සමඟ ඉතා සමීප සම්බන්ඳතා පැවැත්වා ඇති ආකාරය එරට ඉතිහාස වාර්ථා තුළින් ද මනාව තහවුරු වේ. ඉතා ප්‍රභල චෝල පාලනයට එරෙහිව සිටින විජයබාහු රජුට සහාය දැක්වීම සඳහා බුරුම රජු ගන්නා තීරණය දේශපාලනයමය වශයෙන් අනතුරුදායක තීරණයක් වුව ද දෙරට අතර ආගමික වශයෙන් ඇති සබැඳියාව හා චෝල පාලනයේ කෲර ක්‍රියා කලාපය මෙන්ම එතුමා ඉතාමත් ශ්‍රද්ධාසම්පන්න බෞද්ධයෙක් වූ හෙයින් අනුරාධපුර පූජණීය නගරය මුදවා

ගැනීමට ඇති කැමැත්ත එම තීරණයට හේතු භූත වන්නට ඇත.

බුරුම ශ්‍රී ලංකා රජවරු අතර සන්නිවේදනය වෙළඳුන් මාර්ගයෙන් මෙන්ම භික්ෂූන් වහන්සේලා හරහා සිදුව ඇත. බුරුම රජුගේ ප්‍රධාන අනුශාසක වූයේ ද ෂින් අරහත් හෙවත් ධර්මදස්සී නම් ථේරවාදී බෞද්ධ භික්ෂුවකි. චිරාත් කාලයක සිට ථේරවාදී බෞද්ධයන්ගේ මූලස්ථානය වූ අනුරාධපුරය මුදා ගැනිමේ අවශ්‍යතාවය බුරුම බෞද්ධයන්ට ද තිබෙන්නට ඇත. මෙහි දි අවධාරණය කළ යුතුව ඇත්තේ බුරුමය සමග ඇති සබඳතා ආගමික මුහුණුවරකින් ක්‍රියාත්මක වී ඇති බවය. විජයබාහු රජු විශේෂයෙන්ම සිය රාජ්‍යයේ ආරක්ෂාව සුරක්ෂිත කරනු පිණිස අසැල්වැසි ඉන්දියාවේ හිතවත් රාජ්‍යයන් සමඟින් විවාහ සම්බන්ධතා ගොඩනගා ගැනීම විශේෂිතය. එමගින් රාජ්‍යයන් දෙකෙහිම ආරක්ෂාව මෙන්ම සබඳතාවයන් ද තහවුරු වේ. පොළොන්නරුව ලෝක උරුමයක් වන්නට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය කාලයයි. ලංකාව කෘෂිකර්මාන්තයෙන් දියුණු කළ හැකි බව එතුමාගේ ආර්ථික ප්‍රතිපත්ති තුළින් මනාව ගම්‍යමාන වේ. පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය අවධියේ සියලු අංශයන්ගේ පැවැති සශ්‍රීකත්වය විදේශීය රාජ්‍ය හා සම්බන්ධතා ආරම්භ වීමට මෙන්ම වර්ධනය වීමට ද හේතු වී ඇත. පරාක්‍රමබාහු රජු දවස බුරුම රජු කරන ලද නොමනා ක්‍රියාව හේතුවෙන් රජු බුරුම රට මුදා හරින්නට හේතු වන්නේ දෙරටේ ආගමික සම්බන්ධතාවයයි.

පරාක්‍රමබාහු රජ දවස ඉන්දියාවේ මිත්‍ර රාජ්‍යයන් සමඟ පැවැත් වූ සබඳතා ඉතා බලවත් වූ බව පාණ්ඩ්‍ය රාජ්‍යයේ සිහසුන සෝලීන්ගෙන් නැවත ලබා ගැනීමට යුද සේනාවක් පිටත් කිරීමෙන් සනාථ වේ. ගෝකණ්ණ වරාය ආසන්න වන්නට පිහිට තිබූ පොළොන්නරුව යුගයේ විදේශ සම්බන්ධතා විවිධ මූලාශ්‍රයන් තුළ අන්තර්ගතව ඇත. පුලස්ති නගර, කඳවුරු නුවර, කඳවුරුපුර නුවර, විජයරාජපුරම්, කාලිංගරාජපුරය රාජරාජ පුරය, ජනනාථ මංගලම්, පුලනරි ආදී නාමයන්ගෙන් හැඳින්වෙන පොළොන්නරුව 1982 දී ලෝක උරුමයක් බවට නම් කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය


*පූජාවලිය,* (2006), සංස්: කිරිඇල්ලේ ඥාණවිමල හිමි, නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මහාවංශය සිංහල*, (2004), නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මහාවග්ගපාළිය 1, (1957), කොළඹ, බුද්ධජයන්ති මුද්‍රණය.


### ද්විතීයික මූලාශ්‍රය


අදිකාරම්, ඊ. ඩබ්ලිව්., (2013), *පැරණි ලක්දිව ඉතිහාසය*, නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ඉන්ද්‍රකීර්ති, සිරිවීර, (2005), *රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානී*, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

මලලසේකර, ගුණපාල, (2014), *ශ්‍රී ලංකා පාලි සාහිත්‍යය*, නැදිමාල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මුදියන්සේ, නන්දසේන, (2016), *ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය*, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

A. Veluppillai (1971). *Ceylon Tamil Inscriptions*, Royal printer, Kandy.

Archaeological Department Centenary (1890-1990): Architecture. (1990). Commissioner of Archaeology, Sri Lanka.

Arunachalam, p. (2004), *Polonnaruwa Bronzes and Siva Worship and Symbolism*, New Delhi, Asian Educational Services.

Veluppillai, A, (1971), *Ceylon Tamil Inscriptions part 1*, Kandy, Royal Printers.

Wickremasinghe, Don Martino De Zilva, (1928), *Epigraphia Zeylanica Vol-2*, London, Published For the Government of Ceylon by Humphrey Milford Oxford University Press.

Harvey, g.e.,(1925), *History of Burma*, New York, Longmans Green and co.

Indrapala, Karthigesu. (1963). '*The Nainativu Tamil inscription of Parakramabahu I*,' University of Ceylon Review.

Lee, R. (2012) *Construction community*: Tamil merchant temples in India and China, 8501281, Graduate school of art and science, Colombia University.

Mendis, G.C. (1996). **The Early History of Ceylon and Its Relations with India and Other Foreign Countries**. Asian Educational Services.

Ranasinghe G (2013), *Maritime Cultural interaction between Sri Lanka and China Based on archaeological artifacts of both countries*, Xiamen University, China.

Salan, AS. (2012) *The ancient Hindu Heritage Site in the Qunzhou port in Chunming, W. Maritime Cultural heritage and archaeology in the Surrounding China*, Science press, Beijing.

Sastri, K.A. Nilakanta, (1955), *The Colas*, Madras, University of madras.

Shravasti Dhammika (2008). Sacred Island. Buddhist Publication Society.

Sirisena, w.m.,(1978), **Sri Lanka and South-East Asia**: Political, Religious and Cultural Relations from A.D. C. 1000 to C. 1500, Sri Lanka University Press.

Vohra, N.N. and Jyotindra Nath Dixit (1998). *Religion*, Politi, and Society in South and Southeast Asia. Konark Publishers Pvt, Limited.